ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2293/27 – 2022 අගෝස්තු 17 වැනි බදාදා – 2022.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2017/193.

කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.12.28 දිනැති හා අංක 2208/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගලිගමුව නගරය, බල්ලපාන, දම්මල පාර, වැරැල්ලපත පදිංචි එම්. ජේ. චන්ද්‍රතිලක මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජූලි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 37250 – 11 (2022/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කාර්මික අධිකරණය - කොළඹ

එම්. ජේ. චන්ද්‍රතිලක මයා,
වැරැල්ලපත, දම්මල පාර,
බල්ලපාන,
ගලිගමුව නගරය.

ආරවුල් අංකය: IR/COM/03/2017/193

බේරුම්කරණ අංකය: A /05/2021

පැමිණිලිකරු

එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරු

2022 ජූනි මස 07 වැනි දින දී ය.

බේරුම්කරණ තීන්දු ප්‍රකාශය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ V ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) වරයෙකු වශයෙන් සේවය කරන එම්. ජේ. චන්ද්‍රතිලක මහතාට අදාළ ශ්‍රේණියට හිමි වැටුප් තලය ලබා නොදීම යුක්ති සහගත ද යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේ නම් ලබා දිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

මෙම ආරාවුල සම්බන්ධයෙන් පළමු හා දෙවන පාර්ශවයන් විසින් සිය පළමු හා දෙවන ප්‍රකාශ ඉදිරිපත් කර තිබුණි.

මෙම ආරාවුල 2018.04.11 දිනැති අංක IR/COM/03/2017/193 සහ ලිපිගොනු A/31/2018 යටතේ බේරුම්කරණය සඳහා බේරුම්කරු නීතිඥ නන්දසේන බැදිගම මහතා වෙත යොමු කර තිබුණු අතර ඔහුගේ පෞද්ගලික අපහසුතා හේතුවෙන් මෙම ආරාවුල බේරුම්කරණ කටයුතු සිදුකිරීමෙන් ඉවත් වී තිබුණි. ඉන් අනතුරුව මෙකී ආරාවුල 2018.08.20 දිනැති අංක IR/COM/03/2017/193 සහ ලිපිගොනු අංක A/63/2018 යටතේ පරීක්ෂණය සිදුකිරීමට නව බේරුම්කරුවෙකු වශයෙන් එස්. ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කර තිබූ අතර මෙම පරීක්ෂණ කටයුතු ඔහු විසින් අඩක් සිදුකර තිබුණි. පරීක්ෂණ වාර කිහිපයකට පසු මෙම පරීක්ෂණ නතර වී තිබූ අතර බේරුම්කරණ පරීක්ෂණය කරගෙන යාම සඳහා 2020.03.02 දිනැති අංක IR/COM/03/2017/193 සහ ලිපිගොනු අංක A/05/2020 යටතේ බේරුම්කරු ඩී.එම්. කරුණාරත්න මහතා වෙත යොමු කර තිබුණි.කෙසේ නමුත් එකී බේරුම්කරණ පරීක්ෂණය ඔහු විසින් පවත්වාගෙන ගොස් නොතිබූ අතර ඉන්පසු එකී බේරුම්කරණය 2020.12.10 දිනැති අංක IR/COM/03/2017/193 සහ ලිපිගොනු අංක A/05/2021 යටතේ මා වෙත යොමු කර තිබුණි.

ඒ අනුව මෙම ආරාවුල 2021.01.27 වැනි දින මුල්වරට මා ඉදිරියේ කැඳවන ලදී. මෙම පරීක්ෂණය බේරුම්කරු එස්. ජී. සූරියආරච්චි මහතා විසින් අඩක් නිම කර තිබූ බැවින් ඔහු විසින් පරීක්ෂණ කටයුතු නතර කර ඇති තැන සිට නැවත පරීක්ෂණ කටයුතු ආරම්භ කරන මෙන් දෙපාර්ශවයෙන් ම සිදු කළ ඉල්ලීම අනුව මෙම පරීක්ෂණය අවසන් කර ඇති පියවරෙහි සිට ඉදිරියට ගෙනයාමටත් කලින් අසන ලද සාක්ෂි ආවේශ කර ගැනීමටත් දෙපාර්ශවයේම එකඟතාවය මත මා තීරණය කරන ලදී.

පළමු පාර්ශවය පැමිණිලිකරු 1982.01.12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වේරහැර කාර්මික අභ්‍යාස ආයතනයේ සිව් අවුරුදු පාඨමාලාවක් හදාරා ඇති අතර ඉන්පසු 1986.03.04 වැනි දින සිට දෙවන පෙළ පුහුණු කාර්මිකයකු ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ලයේ ස්ථිර පත්වීමක් ලැබ ඇත.

පළමු පාර්ශවය පැමිණිලිකරු 2007 වර්ෂයේ වගඋත්තරකාර ආයතනය විසින් පවත්වනු ලැබූ සහකාර කළමනාකාර (ඉංජිනේරු) V ශ්‍රේණියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිට එහි දී සුදුසුකම් මත තෝරා ගැනීමෙන් පසු 2009.06.30 දින හා ශ්‍රීලංගම/මාසක/විධා/පත්/2009 දරන ලිපිය මගින් පැමිණිලිකරු V ශ්‍රේණියේ සහකාර කළමනාකර (ඉංජිනේරු) තනතුරකට පත් කර ඇත. එකී පත්කිරීමේ ලිපියේ සත්‍ය පිටපතක් පැමිණිල්ල විසින් 2021.02.21 දිනැතිව ගොනු කරන ලද දිවුරුම් ප්‍රකාශයේ A2 ලෙස සලකුණු කර ඇති අතර එකී ලිපිය වගඋත්තරකාර පාර්ශවය විසින් සත්‍ය පිටපතක් ලෙස පිළිගන්නා ලද ලේඛනයක් වේ.

මෙකී ආරාවුලට ප්‍රධාන වස්තු විෂය වී ඇත්තේ එකී A2 පත්කිරීමේ ලිපියේ 4 වැනි ඡේදයෙහි සඳහන් ''තවද මෙසේ පත්කිරීමේ දී ඔබගේ වැටුපෙහි වෙනසක් සිදු නොවන අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු අදාළ වැටුප ගෙවීමට කටයුතු කරනු ඇත.'' යන කොන්දේසිය වන බවත් නිරීක්ෂණය වේ.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් සිය ලිඛිත දේශනය මගින් දක්වා ඇති ස්ථාවරයන් පහත පරිදි සම්පිණ්ඩනය කළ හැකිය.

A. පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් R6 ලෙස ලකුණු කරන ලද කොන්දේසි සහිත පත්කිරීමේ ලිපිය පිළිගෙන ඇති අතර එවැනි කොන්දේසි සහිත පත්වීම් ලිපි ලබා දීම දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනයේ සාමාන්‍ය සම්ප්‍රදායක් බවත්, එවැනි ආකාරයේ පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා 2005 අංක 27 දරන ලංකා ගමනාගමන මණ්ඩල පනත අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලයට බලය පැවරී ඇති බවත්,

B. R6 ලෙස ලකුණු කරන ලද පත්වීමේ ලිපියේ සඳහන් R6(a) ලෙස ලකුණු කර ඇති කොන්දේසියට අදාළව අධ්‍යක්‍ෂ මණ්ඩලය තීරණය ගෙන ඇත්තේ 2018.03.15 වැනි දින බවත් එකී තීරණය අනුව පැමිණිලිකාර පළමු පාර්ශවය පසු රහිතව නියමිත ශ්‍රේණියට අදාළ වැටුප් තලයේ පිහිටුවීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය පිළිගෙන අනුමත කර තිබෙන බවත්,

C. පැමිණිලිකාර පළමු පාර්ශවය කිසිදු අයුරකින් වෙනස් කොට සැලකීමකට ලක් කර නොමැති බවත්, ආයතනයේ වෙනත් තනතුරු සඳහා ද එවැනි කොන්දේසි සහිත පත්වීම් ලිපි ලබා දී ඇති බවත්,

D. මෙකී ආරාවුල සජීවී ආරවුලක් නොවන බවත්, 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙම ආරාවුල පරීක්ෂා කිරීම සඳහා කාර්මික අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවත් ය.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් ඉහත දක්වා ඇති ස්ථාවරයන් සම්බන්ධයෙන් එහි A, B සහ C යන කරුණු මෙකී පරීක්ෂණයේ දී ප්‍රශ්නගත වී ඇති A2 සහ R6 ලෙස දෙපාර්ශවය විසින් වෙන වෙනම ලකුණු කර ඇති පත්වීමේ ලිපිය හා එහි ආනුෂාංගික කරුණු බැවින් එකී A, B සහ C ස්ථාවරයන්හි සඳහන් කරුණු බේරුම්කරණ තීරණය ලබාදීමේ දී පොදුවේ සලකා බැලීමටත් කාර්මික අධිකරණයේ අධිකරණ බලය සම්බන්ධයෙන් වන D ස්ථාවරය සම්බන්ධයෙන් වෙනම කරුණු සලකා බැලීමටත් තීරණය කරමි.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනයේ A, B සහ C දරන ස්ථාවරයන් සම්බන්ධ කාර්මික අධිකරණයේ ස්ථාවරය :

බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇති ආරවුලේ විසඳිය යුතු පළමු ප්‍රශ්නය වන්නේ "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ V ශ්‍රේණියේ සහකාර කළමනාකර (ඉංජිනේරු) වරයෙකු වශයෙන් සේවය කරන එම්. ජේ. චන්ද්‍රතිලක මහතාට අදාළ ශ්‍රේණියට හිමි වැටුප් තලය ලබා නොදීම යුක්ති සහගත ද? " යන්න වේ.

ඒ අනුව බේරුම්කරණ අධිකරණය විසින් විසඳිය යුතු ප්‍රශ්න කවරේද යන්න පහත පරිදි දක්වා සිටිමි.

1. එම්. ජේ. චන්ද්‍රතිලක මහතාට V ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) වරයෙකුට හිමි B ශ්‍රේණියට අදාල වැටුප් තලය ලැබීමට හිමිකමක් පවතී ද?

2. 1 වන ප්‍රශ්නයට පිළිතුර 'ඔව්' ලෙස ලැබේ නම් එකී හිමිකම බලාත්මක වන්නේ කවදා සිට ද?

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂි මෙහෙයවීමේ දී ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කරන ලද සහ සිය ලිඛිත දේශන මගින් ඉදිරිපත් කර ඇති R 14 ලෙස ලකුණු කර සත්‍ය පිටපතක් බවට සහතික කර ඇති 2018.03.15 දිනැති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2018 වර්ෂයේ 03 වන අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීම් වාර්තාවේ පත්‍රිකා අංක 28 හි සඳහන් පළමු ඡේදය උපුටා දක්වමි.

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ විවිධ සේවා ස්ථානවල පැවැති තනතුරු පුරප්පාඩු සඳහා අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණ පවත්වා උසස්වීම් ලද සේවක මහත්ම/මහත්මීන් හට තනතුරට අදාළ ශ්‍රේණිය ලබා දී ඇති නමුත් එම නිලධාරීන්ට "නියමිත ශ්‍රේණියට හිමි වැටුප අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු ගෙවීමට කටයුතු කරනු ඇත" ලෙස පත්වීමේ ලිපියේ සඳහන් කර ඇත. නමුත් මෙම සේවකයින් එම වැටුප් තලයෙහි මේ දක්වා පිහිටුවා නොමැති බැවින් එම නිලධාරීන් තනතුරට පත්කළ දින සිට පසු පඩි රහිතව අදාළ ශ්‍රේණියෙහි හිමි වැටුප් ක්‍රමයේ පිහිටුවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතියට ප්‍රධාන මානව සම්පත් කළමනාකාර විසින් මෙම පත්‍රිකාව ඉදිරිපත් කර ඇත."

අධක්ෂ මණ්ඩල පත්‍රිකාවේ ඉහත ඡේදයේ අඩංගු " **.. අදාල ශ්‍රේණියේ හිමි වැටුප් ක්‍රමයේ පිහිටුවීම සඳහා ..**" සහ " **.. නමුත් මෙම සේවකයින් එම වැටුප් තලයෙහි මේ දක්වා පිහිටුවා නොමැති බැවින් එම නිලධාරීන් තනතුරට පත්කළ දින සිට පසු පඩි රහිතව අදාළ ශ්‍රේණියෙහි හිමි වැටුප් ක්‍රමයේ පිහිටුවීම සඳහා..**" යන වගන්තිය කෙරෙහි අවධානය යොමු කරමි. එකී වගන්ති අනුව පැහැදිලිවන කරුණු වන්නේ එක් එක් ශ්‍රේණියට අදාල නිශ්චිත වැටුපක් පවතින බවත් යම් නිලධාරී මහත්ම/මහත්මීන් පිරිසකට අදාළ ශ්‍රේණියේ හිමි වැටුප ඉහත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළ දින වන විටත් නොගෙවා ඇති බවත් ය.

තවද R 14 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත.

"පත්‍රිකාව හා අන්තර්ගත ඇමුණුම් අනුව මෙලෙස ලබා දී ඇති පත්වීම් අතරින් ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ VIශ්‍රේණියේ වැඩ මූලික ලෙස කටයුතු කළ එම්.ජී. චන්ද්‍රතිලක මහතා වෙත 2009/04/30 දින ලබා දී ඇති V ශ්‍රේණියේ ඉංජිනේරු පත්වීමට අදාළ නියමිත වැටුප් සකස් කර නොමැති නිසා ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ පැමිණිල්ලක් කර ඇති අතර, මේ පිළිබඳ එම දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශයේ පැමිණිල්ල විභාග වෙමින් පවතී."

ඉහත උපුටාගත් ඡේදය අනුව එහි පැහැදිලිව දක්වා ඇත්තේ "**පත්වීමට අදාළ නියමිත වැටුප සකස් කර නොමැති නිසා**" ගම්පහ කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවයි.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් R6 (a) ලෙස ලකුණු කර ඇති පත්වීමේ ලිපියේ අඩංගු කොන්දේසිය ලෙස දක්වා ඇත්තේ "**තවද මෙසේ පත් කිරීමේ දී ඔබගේ වැටුපෙහි වෙනසක් සිදු නොවන අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු අදල වැටුප ගෙවීමට කටයුතු කරනු ඇත.**" ලෙසය.

ඉහත සඳහන් කල R 14 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව මගින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මෙසේ සඳහන් කර ඇත.

"**.....මණ්ඩලය විසින් විධිමත් අයුරින් සම්මුඛ පරීක්ෂණ පවත්වා පුරප්පාඩු පවතින තනතුරුවලට සුදුසුකම්ලත් අයට පත්වීම් ලබා දී තිබේනම් ඔවුන්ට එම තනතුරේ වේතනය එම නිලධාරීන්ට හිමිවිය යුතු වේ.**"

මේ අනුව පැහැදලිව සඳහන් කර ඇත්තේ "**තනතුරේ වේතනය එම නිලධාරීන්ට හිමිවිය යුතු වේ.**" යනුවෙනි. ඒ අනුව තහවුරු වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය වන්නේ ද කිසියම් තනතුරක් සඳහා සුදුසුකම් අනුව පත්වීමක් ලබා දී ඇති අවස්ථාවක එහි තනතුරට හිමි වැටුප ගෙවිය යුතු බවයි.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය මෙම පරීක්ෂණය ආරම්භයේ සිටම දරන ලද ස්ථාවරය වූයේ R6 (a) ලෙස ලකුණු කර ඇති පත්වීමේ ලිපියේ අඩංගු කොන්දේසියේ සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පැමිණිලිකාර පාර්ශවය විශ්‍රාම යන තුරුත් කිසිදු අවස්ථාවක දී ලැබී නොතිබුණු බවයි. එසේ වුවද ලිඛිත දේශනය සමඟ ඉදිරිපත් කර ඇති R14 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.03.15 වැනි දින එකී වාර්ථාව අනුමත කර ඇති බවයි.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් බේරුම්කරු එස්. ජී. සූරිආරච්චි මහතා විසින් සිදු කරන ලද අංක A/63/2018 දරන පරීක්ෂණයේ විභාගය ආරම්භයේ දී 2019.03.06 වන දින ගොනු කරන ලද සංශෝධිත උත්තර ප්‍රකාශය මගින් එවැනි අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක් පිළිබඳ කිසිඳු සඳහනක් ඉදිරිපත් කර නොමැත.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් 2019.09.20 දින සාක්ෂියට කැඳවන ලද එකී ආයතනයේ පරිගණක දත්ත ක්‍රියාකරුවෙකු ලෙස සේවය කරනු ලබන තුෂාන්ති මද්දුම ලියනගේ විසින් ලබාදුන් සාක්ෂියට අවධානය යොමු කරමි.

"ප්‍රඃ මහත්මිය තමුන් වගඋත්තරකාර ආයතනයේ වර්තමානයේ දරන තනතුර කුමක් ද?
පිඃ පරිගණක දත්ත ක්‍රියාකරු. පෞද්ගලික ලිපිගොනු භාරව තමයි කටයුතු කරන්නේ."

"ප්‍රඃ මහත්මියද මේ ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපිගොනුව භාරව ඉන්නේ?
පිඃ ඔව්"

"ප්‍ර : අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය හම්බවුණාද ?

පි : මේ මහත්මයා විශ්‍රාම ගන්නා තෙක්ම හම්බවුණේ නෑ."

බේරුම්කරු එස්. ජී. සූරිආරච්චි මහතා ගෙන් පසු මෙම පරීක්‍ෂණයේ කටයුතු මා විසින් නැවත ආරම්භ කිරීමෙන් පසු 2022.01.20 දින දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් වැඩිදුර මූලික සාක්‍ෂි ලබාදෙමින් එකී ආයතනයේ පරිගණක දත්ත ක්‍රියාකරුවෙකු ලෙස සේවය කරනු ලබන තුෂාන්ති මද්දුම ලියනගේ යන අය විසින් මා ඉදිරියේ ලබාදුන් වැඩිදුර මූලික සාක්‍ෂියට අවධානය යොමු කරමි.

"ප්‍ර : මෙම ඉල්ලුම්කරු විශ්‍රාම ගැන්වීමට පෙර එම අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතියට අදළ ලේඛන තමාට ලැබුණා ද ?

පි : නැහැ

ප්‍ර : ඒ කියන්නේ මෙම ඉල්ලුම්කරු විශ්‍රාම ගැන්වීමට පෙර එම අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතියක් වගඋත්තරකාර ආයතනයේ සිදු වී නැහැ කියන එක නේද ?

පි : ඔව්"

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් සාක්‍ෂියට කැඳවන ලද එකී ආයතනයේ ප්‍රධාන මානව සම්පත් කළමනාකාර තනතුර දරන ජී. ඩබ්ලිව්. චම්පිකා මල්කාන්ති යන සාක්‍ෂිකාරියගේ සාක්‍ෂිය කෙරෙහි අවධානය යොමු කරමි.

"ප්‍ර : සාක්‍ෂිකරු මෙම පත්වීමේ ලිපිවල කොන්දේසියක් දක්වෙනවා. එසේ පත්කිරීමේ දී ඔබගේ වැටුපේ කිසිදු වෙනසක් සිදු නොවන අතර, අදාල වැටුප අධ්‍යක්‍ෂක මණ්ඩල තීරණයකින් පසු ගෙවීමට කටයුතු කරනු ලබන බව ද දන්වමි කියලා. එතකොට සාක්‍ෂිකරු මෙහි සඳහන් වන විදිහට අධ්‍යක්‍ෂක මණ්ඩල තීරණයක් ආවාද ?

පි : අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයක් ඇවිත් තිබෙනවා".

ප්‍ර : "මට මේ අධ්‍යක්‍ෂක මණ්ඩල තීරණය බලලා කියන්න මේ තීරණයේ දිනය කවද ද ?

පි : 2018. 09. 15"

මෙකී සාක්‍ෂිකාරියගෙන් විමසන ලද හරස් ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමි.

"ප්‍ර : මහත්මිය තමුන් පිළිගන්නවාද මේ කියන පරිදි අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයක් අවම වශයෙන් 2018.03.15 වන දින හරි අරන් තිබුණානම් තමුන්ලා ගරු අධිකරණයට දෙපාරක් උත්තර ගොනු කිරීමේ දී ඒවා ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබුණා කියලා ?

පි : 2018 ඉඳලා එහෙම හැකියාවක් තියෙන්න ඕනේ."

පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් සිය ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර ඇති පහත ස්ථාවරය පිළිබඳව අවධානය යොමු කරමි.

"... මෙම තත්වය වගඋත්තරකරු තම **X1, X2** තමාගේ පිළිතුරු මගින් ගෙන ඇති ස්ථාවරය සමග නැවත ගැටෙන අතර, **X1** හා **X2** පිළිතුරු ප්‍රකාශවල ඡේද අංක 12 යටතේ ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරුගේ පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාර සියළුම වැටුප් ගෙවා ඇති බවය. එය සත්‍යයක් නම් 2018.03.05 දින අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් එකී වැටුප ගෙවීමට තීරණය කලා යන්න ප්‍රකාශ කිරීමෙන් වගඋත්තරකරුගේ ස්ථාවරය ප්‍රතිබන්ධනය වී ඇති අතර, තවත් සුවිශේෂී නෛතික කරුණක් වන්නේ **X1** හා **X2** තමාගේ පිළිතුරු ප්‍රකාශ ගරු අධිකරණය ගොනු කර ඇත්තේ, 2019 හා 2020 වසරවල වන අතර, 2018.09.15 දින අධ්‍යක්‍ෂ මණ්ඩලය ඉල්ලුම්කරුගේ වැටුප් සම්බන්ධයෙන් තීරණයක් ගෙන තිබුණේ නම් පිළිතුරු ප්‍රකාශයේ එම සඳහන් නොකිරීමෙන් 2018.09.15 දින අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය අභියෝගයට ලක් වී ඇති බැව් සැලකර සිටී."

මෙකී සාක්ෂි සම්පිණ්ඩනය කර බැලීමේ දී තහවුරු වන්නේ මෙම ආරාවුලේ බේරුම්කරණ පරීක්ෂණය ආරම්භයේ සිටම දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් දරන ලද ස්ථාවරය, සහ ලබා දී ඇති සාක්ෂි සමග 2022. 03. 11 වන දින ලබා දී ඇති සාක්ෂි හා **R** 14 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ අඩංගු කරුණු සහ ලිඛිත දේශන මගින් ගෙන ඇති ස්ථාවරය පරස්පර වන බවයි. පැමිණිලිකරු විශ්‍රාම යන තුරුත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට එළඹ නොමැති බව මූලික සාක්ෂිවලින් ප්‍රකාශ කර තිබුණ ද 2018. 09. 15 දින අධ්‍යක්ෂ මණ්ඩල ගත් තීරණයක් පිළිබඳව ඉදිරිපත් කර ඇති කරුණු සමග සාක්ෂි එකිනෙක ගැටේ. එබැවින් දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් ලබා දී ඇති සාක්ෂිවල විශ්වාසනීයභාවය බිඳ වැටී ඇත.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් එකී ආයතනයේ නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු (කම්කරු සබඳතා) විසින් 2022. 02. 28 දින හරස් ප්‍රශ්න විමසීමේ දී ලබාදුන් සාක්ෂි කෙරෙහි අවධානය යොමු කරමි.

"ප්‍ර : ඔබ මානව සම්පත් අංශයේ වැඩ කරන නිලධාරියෙක් වශයෙන් ආයතනයේ සේවකයින්ට ආයතනයේ පවත්නා ක්‍රමවේදය අනුව තනතුරු ලබාදීමේ දී එම තනතුර සහ ශ්‍රේණිය විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි නේද පත්වීම් ලිපියේ ?

පි : සඳහන් කළ යුතුයි.

ප්‍ර : ආයතනයේ පවතින පිළිවෙත් ප්‍රකාරව ඔබ 5 වන ශ්‍රේණියේ නිලධාරියෙකු නම් ඒ ශ්‍රේණියට අදල වැටුප ඔබට හිමිනේද?

පි : එහෙමයි."

"ප්‍ර : කෙසේ නමුත් නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු වශයෙන් 8 වන ශ්‍රේණියට බැඳුණු ඔබට 5 වන ශේණියට උසස්වීමේ දී එම 5 වන ශ්‍රේණියට අදල වැටුප ඔබට ලැබුණු බව ඔබ දැනටමත් පිළිගෙන ඇත. ඒ අනුව ඔබ පිළිගන්නවාද ශ්‍රී ලංගම සියලුම සේවකයන්ට වගඋත්තරකරු එක හා සමානව සැලකිය යුතුයි කියලා ?

පි : පිළිගන්නවා.

මෙකී පරීක්ෂණයට අදල සාක්ෂි සහ ලිඛිත දේශන අනුව පෙනී යන්නේ දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් R6 (a) ලෙස ලකුණු කර ඇති විශේෂිත කොන්දේසිය ආයතනය විසින් පත්වීම් ලබාදීමේ දී සාමාන්‍යයෙන් යොදන කොන්දේසියක් බවත් එවැනි අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් පසු අදල ශ්‍රේණියට හිමි වැටුප ලබාදීමට කටයුතු කරන බවත් ය.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතයේ ලිඛිත දේශනයේ 10 ඡේදයට අවධානය යොමු කරමි.

" furthermore, it holds utmost importance on the fact that the said term 'R6(a)' appears exactly as 'R12(a) and 'R13(a)' on the letters of appoinment dated 12.02.2009 and 06.02.2009 respectively, substantiating that the Second party, <u>as a practis</u> has imposed the said term, upon the powers vested in the Board of Directors."

2022.03.11 වන දින දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ප්‍රධාන මානව සම්පත් කළමනාකාරී ජී. ඩබ්ලිව්. චම්පිකා මල්කාන්ති විසින් ලබාදුන් සාක්ෂිය වෙත අවධානය යොමු කරමි.

"ප්‍ර : මට කියන්න මේ නඩුවේ පළමුවන පාර්ශවය සඳහා පළමුවන පාර්ශවයට අදල වෙන විශේෂ කොන්දේසියක් එයාගේ පත්වීමේ ලිපියේ දක්වලා තිබෙන R6 (a) කොන්දේසිය මෙහෙම කොන්දේසියක් තිබෙන එකම පත්වීම මෙය ද?

පි : ඔය වෙලාවේදී නිකුත් කරපු ගොඩක් පත්වීම්වලට ඕක දලා තිබෙනවා. මේ මහත්මයාට විතරක් පොදුවේ දලා නැහැ."

මෙකී පත්වීමේ ලිපියේ ඇති R6 (a) විශේෂ කොන්දේසිය ආයතනයේ භාවිතයක් ලෙස පොදුවේ යොද ගන්නා කොන්දේසියක් බවට වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය වී ඇත. එහෙත් R 14 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාවේ අඩංගු පහත කරුණ දෙස අවධානය යොමු කරමි.

"... ගරු සභාපතිතුමාගෙන් උපදෙස් පතා ඇමතු ලිපියට (ඇමුණුම් අංක 03) මෙවැනි පත්වීම් ලද අයගේ විස්තර ගෙන්වා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අනුමැතිය ලබා දී ඇත. මේ අනුව ප්‍රධාන මානව සම්පත් කළමනාකාර විසින් ඔහුගේ (ඇමුණුම් අංක 04 හා 05) ලිපි මගින් තොරතුරු ගෙන්වා ඇති අතර, එහි දී <u>මෙවැනි පත්වීම් 7 ක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වී ඇත.</u> එම ලිපි විස්තර (ඇමුණුම් අංක 06) ලෙස ගොනු ගත කර ඇත."

එකී අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව අනුව පැමිණිලිකරුට ලබා දී ඇති ආකාරයේ විශේෂිත කොන්දේසි සහිත පත්වීම් 07 ක් පමණක් ලබා දී ඇති බව දක්වා ඇත. විශාල සේවක සංඛ්‍යාවක් රාජකාරි කටයුතු කරනු ලබන වගඋත්තරකාර ආයතනය තුළ 07 දෙනෙකුට පමණක් මෙම කොන්දේසිය පනවා තිබීම මගින් ''විශේෂිත කොන්දේසිය පැනවීම'', සාමාන්‍ය භාවිතයක් ලෙස හුවා දැක්වීමට කටයුතු කිරීම මෙම පරීක්ෂණයේ කරුණු නොමග යැවීමට ගත් උත්සාහයක් සේ සලකමි.

සියලු සාක්ෂි සම්පිණ්ඩණයේ දී ඉහත දක්වන ලද කරුණුවලට පරිබාහිරව අනාවරණය වන පහත වැඩිදුර කරුණු පිළිබඳව මාගේ අවධානය යොමු කරමි.

(අ.) R 14 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ගෙන ඇත්තේ 2018.09.15 වන දිනය. ඉල්ලුම්කරු වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2019.08.06 විශ්‍රාම ලබා ඇත. එකී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය 2018.09.15 දින ලබා දී ඇත්නම් එදින සිට විශ්‍රාම ලබාගත් 2019.08.06 වන දින දක්වා ගෙවනු ලැබූ වැටුප V ශ්‍රේණියට අදළ වැටුප ගෙවනු ලැබිය යුතු වුවත් එකී වැටුප ගෙවා නොමැත.

(ආ.) පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් ඔහුට සිදුවී ඇති අගතිය පිළිබඳව දිගින් දිගටම පාලනාධිකාරය දැනුවත් කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් කිසිදු පිළිතුරක් සැපයීමට පාලනාධිකාරය අපොහොසත් වී ඇති බව සහ එවැනි පිළිතුරක් සැපයූ බවට සනාථ කළ හැකි කිසිදු ලේඛනයක් පෞද්ගලික ලිපි ගොනුවේ නොමැත.

2022.02.28 දින දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා) ගයාන් තුඩුගල විසින් ලබා දුන් සාක්ෂි වෙත අවධානය යොමු කරමි.

"ප්‍ර : පත්වීම් ලිපියේ එකී ප්‍රකාශය සම්බන්ධයෙන් සහ ඉල්ලුම්කරුට තමාට ලබා දී ඇති V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරට හිමි අදළ ශ්‍රේණියට හිමි වැටුප ගෙවන ලෙසට මම ඉල්ලලුම්කරුට වගඋත්තරකාර ආයතනයෙන් ලිඛිතව 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම ලිඛිත ඉල්ලීම් කරලා තිබෙනවා නේද ?
පි : තියෙනවා
පි : ඒ එකදු ලිපියකටවත් ඉල්ලුම්කරුට පිළිතුරක් දීලා තිබෙනවද තමුන්ලා ?
ප්‍ර : එම ලිපි පෞද්ගලික ලිපි ගොනුවට ලැබිලා නැහැ. "

(ඇ.) පැමිණිලිකාර පළමු පාර්ශවය V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරට පත් කරන ලද 2009.06.30 ලිපිය ප්‍රකාරව 2009.07.01 දින සිට පැමිණිලිකරු විශ්‍රාම ලැබූ 2019.08.06 වන දින තෙක් එකී V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුර පමණක් දරා ඇති බවත් එකී තනතුරට හා ශ්‍රේණියට හිමි වැටුප නොලබා ඇති බව.

(ඈ.) පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් බැවින් සහ එකී තනතුරට අතිකාල දීමනා හිමි නොවන බැවින් එකී තනතුරට පත්වූ 2009.07.01 දින සිට පැමිණිලිකරු විශ්‍රාම ලැබූ 2019.08.06 වන දින තෙක් කිසිදු අවස්ථාවක අතිකාල දීමනා ලබා නොමැති බව.

(ඉ.) පළමු පාර්ශවයේ පැමිණිලිකරු V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරට පත්කරන ලද ආසන්න කාලයේ එනම්, 2010.10.20 දින V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර තනතුරට පත් කරන ලද ඩී. එම්. රූපසිංහ (එකී පත්වීමේ ලිපිය X ලෙස පැමිණිලිකාර පාර්ශවය විසින් ලකුණු කර ඇත.) යන අයට V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරට අදළ ශ්‍රේණියට හිමි වැටුප ගෙවා ඇති බවත් එකම ආයතනයේ එකම තනතුරු දරූ පැමිණිලිකරුට එම වැටුප ගෙවා නොමැති බැවින් පැමිණිලිකරු වෙනස්කොට සැලකීමකට භාජනය වී ඇති බව.

ඉහත සියලු සාක්ෂි හා ලේඛන සලකා බැලීමේ දී මා විසින් තීරණය කරනු ලබන්නේ දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් සිය ලිඛිත දේශන මගින් අවධාරණය කර ඇති A,B සහ C දරන ස්ථාවරයන් බිඳ වැටී ඇති බවත් එකී ස්ථාවරයන් ගරු කාර්මික අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බවත් ය.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනයේ 4 වන ස්ථාවරයන් සම්බන්ධ කාර්මික අධිකරණයේ ස්ථාවරය :

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් සිය ලිඛිත දේශනයේ 4 වන ස්ථාවරය D යටතේ සිය ස්ථාවරය දක්වමින් " The Industrial Court has no jurisdiction to hear and determine this Dispute to grant the reliefs prayed for by the First Party; no 'live dispute'." ලෙස ඉදිරිපත් කර ඇති අතර එකී ස්ථාවරය තහවුරු කිරීම සඳහා පහත සඳහන් නඩු තීන්දු ඉදිරිපත්කර ඇත;

(i) Sc Appeal No. 22/2012
(ii) The State Bank of India v. Sundaraliganm (1971) 73 NLR 514
(iii) ANZ Grindlays Bank v. Ministry of Labour and Others (1995) 2SLR 53
(iv) Perera v. Standard Chartered Bank (1995) 1 SLR 73
(v) CA (Writ) Application No. 99/06
(vi) Ceylon Bank Employees Union v. Yatawara 64 NLR 49

මා විසින් ඉහත කී නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කළ අතර එකී නඩු තීන්දුවල හරය සඳහා විෂය වස්තු වී ඇති ආරාවුල් සහ මෙම ආරාවුලේ ස්වභාවය හා හරය සඳහා වී ඇති විෂය කාරණා එකිනෙකට සමපාත හෝ සමාන නොවේ. ඒ හේතුවෙන් ඉහත නඩු තීන්දු මගින් එළඹ ඇති තීරණයන් මෙම බේරුම්කරණ පරීක්ෂණයෙන් වෙන් කොට සලකමි.

මෙම ආරාවුලේ පහත දක්වා ඇති සිද්ධිමය කරුණු කෙරෙහි අවධානය යොමු කරමි.

a. මෙකී ආරාවුල මුල්වරට බේරුම්කරණය සඳහා ඉදිරිපත් කර ඇත්තේ අංක IR/COM/03/2017/193 සහ ලිපිගොනු අංක A/31/2018 යටතේ බේරුම්කරු නීතිඥ නන්දසේන බැදිගම මහතා වෙත 2018.04.11 දිනය.

b. 2018.04.11 වන දින වන විට මෙම පැමිණිලිකරු දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනයේ සේවකයෙකු වන අතර මෙකී ආරාවුල සජීවී ආරාවුලකි.

c. පැමිණිලිකරු 2019.08.06 වන දින වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ලබා ඇත.

d. මෙකී පරීක්ෂණය මා වෙත බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබුවේ අංක IR/COM/03/2017/193 සහ ලිපිගොනු අංක A/05/2021 යටතේ 2020.12.10 දින වන අතර මා විසින් මෙකී ආරාවුල මුල්වරට කැඳවන ලද්දේ 2021.01.27 වන දින වන අතර එදින හෝ මෙකී පරීක්ෂණයේ සාක්ෂි විභාගය අවසන් වන තුරුම කිසිදු අවස්ථාවක කාර්මික අධිකරණයට මෙකී පරීක්ෂණය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් අධිකරණ බලය නොමැති බවට කිසිදු විරෝධතාවයක් වගඋත්තරකාර දෙවන පාර්ශවයෙන් ඉදිරිපත් වී නොමැත. අධිකරණ බලය සම්බන්ධව විරෝධතාවයක් ඉදිරිපත් කරන්නේ නම් එය මෙකී ආරාවුලේ බේරුම්කරණ කටයුතු ආරම්භ කළ මුල් අවස්ථාවේ දී සිදුකළ යුතු වුවත් ඒවැනි කිසිදු මූලික විරෝධතාවයක් සිදුකර නැත.

e. මෙකී ආරාවුලේ බේරුම්කරණ පරීක්ෂණය අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වීමට පැමිණිලිකාර පළමු පාර්ශවය වගකිව යුතු නොවේ. පරීක්ෂණය මීට පෙර බේරුම්කරුවන් 03 දෙනෙකු වෙත වරින්වර යොමු වී ඇති අතර ඒ සඳහා දීර්ඝ කාලයක් ගත වී ඇත. තවද මා විසින් ආරම්භ කරන ලද බේරුම්කරණ පරීක්ෂණය පවත්වාගෙන යාමේ දී කෝවිඩ්19 වසංගත තත්ත්වය මත පරීක්ෂණයේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට නොහැකි විය.

කාර්මික ආරාවුල් (සංශෝධිත) පනතේ 48 අර්ථ නිරූපන වගන්තියේ "සේවකයා" පිළිබඳ වන අර්ථ නිරූපනය මෙසේ දක්වා සිටිමි.

''workman'' means any person who has entered into or works under a contract with an employer in any capacity,whether the contract is expressed or implied, oral in writing, and whether it is a contract of service or of apprenticeship, or a contract personally to execute any work of labour, and includes any person ordinarily employed under any such contract whether such person is or is not in employmentAt any particular time, and includes any person whose services have been terminated.''

එකී වගන්තියේ පැහැදිලිවම දක්වා ඇත්තේ "and includes any person whose services have been terminated." ඒ අනුව සේවය අවසන් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකුද ඊට ඇතුළත් වේ.

ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව මෙකී ආරාවුල සජීවී ආරාවුලක් බවට මා විසින් තීරණය කරනු ලබන අතර දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් සිය ලිඛිත දේශනයේ D මගින් ඉදිරිපත් කර ඇති ස්ථාවරය මා විසින් ප්‍රතික්ෂේප කරනු ලබයි.

සාක්ෂි විභාගයේ දී අවධාරණය කරන ලද විශේෂිත කරුණු:

මෙකී පරීක්ෂණය බේරුම්කරු එස්. ජී. සූරියආරච්චි මහතා ඉදිරියේ කැඳවන ලද 2019.02.12 වන දින වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් ප්‍රධාන නීති නිලධාරිණී රුවිරාණි ජයකොඩි මහත්මිය ඉල්ලීමක් සිදුකරමින් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කොට ඇති පළමු හා දෙවන ප්‍රකාශ සම්බන්ධයෙන් සංශෝධිත උත්තර ප්‍රකාශයක් නැවත අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීමක් සිදුකර ඇති අතර ඒ සඳහා අවසර ලබා දී ඇත.

ඒ අනුව වගඋත්තරකාර ආයතනය විසින් 2019.03.06 වන දින ගොනු කරන ලද සංශෝධිත උත්තර ප්‍රකාශයේ 11 ඡේදය වෙත අවධානය යොමු කරමි.

"11. මෙම නඩුවේ ඉල්ලුම්කරු 2009 වසරේ දී ලබා දී ඇති පත්වීම් ලිපිය ඉල්ලුම්කරු සිය පළමු ප්‍රකාශය සමග අමුණා ඇති අතර එකී පත්වීමේ ලිපියෙහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ "මෙම සහකාර කළමනාකරු ඉංජිනේරු තනතුරට පත් කිරීමේ දී කිසිදු වැටුපෙහි වෙනසක් සිදුනොවන බවත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් තොරව කිසිදු වෙනසක් සිදු නොවන බවත්" දක්වා ඇති අතර තවද 2010.10.20 දිනැතිව V ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරට පත් කරමින් නිකුත් කරන ලද ප්‍රධාන මානව සම්පත් කළමනාකාර ශ්‍රී ලංගම යන අයගේ සමාංක රැගත් 2009.05.26 දිනැති පත්වීම් ලිපිය වැඩිමනත් වශයෙන් නිකුත් කරන ලද ලිපියේ ඉල්ලුම්කරු පත්වීමේ වැටුප ලිඛිතව දක්වා ඇති බව වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියි.

වගඋත්තරකාර ආයතනය විසින් මෙකී ආරාවුල බේරුම්කරු එම්. ජේ. චන්ද්‍රතිලක මහතා වෙත පවරන ලද අවස්ථාවේ ගොනු කරන ලද 2020.07.14 දිනැති උත්තර ප්‍රකාශයේ 11 වන ඡේදය මගින් ද ඉහත 2019.03.06 දින ගොනුකරන ලද උත්තර ප්‍රකාශයේ දරන ලද ස්ථාවරයම දරා ඇත.

මෙකී ආරාවුල මා වෙත බේරුම්කරණය සඳහා ඉදිරිපත්වන ලද අවස්ථාවේ වගඋත්තරකාර ආයතනය විසින් 2021.03.03 වන දින ගොනු කරන ලද උත්තර ප්‍රකාශයෙහි 11 වන ඡේදය මගින් ද ඉහත 2019.03.06 දින ගොනු කරන ලද උත්තර ප්‍රකාශයේ දරන ලද ස්ථාවරයම දරා ඇත.

මෙකී ආරාවුල මා ඉදිරියේ 2021.03.22 දින කැඳවන ලද අවස්ථාවේ දී පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් වගඋත්තරකාර පාර්ශවයේ දිවුරුම් ප්‍රකාශයේ ඡේද අංක 11 දක්වා ඇති පරිදි 2009.05.26 දිනැති පත්වීම් ලිපිය ඉල්ලුම්කරුට නිකුත් කරන ලෙස ඉල්ලීමක් සිදුකළ අතර වගඋත්තරකාර පාර්ශවය විසින් එකී ලිපිය ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවට ප්‍රකාශ කර ඇත.

මෙකී ආරාවුල මා ඉදිරියේ 2021.12.04 දින කැඳවන ලද අවස්ථාවේ දී පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් ඉහත අධිකරණයට ඉදිරිපත් කිරීමට එකඟ වූ 2009.05.26 දිනැති පත්වීම් ලිපිය ඉදිරිපත් කරන ලෙස නැවත වාරයක් ඉල්ලීමක් සිදුකළ අතර එදින එකී පත්වීමේ ලිපිය වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් නොකිරීම මත එකී ලිපිය මීලඟ පරීක්ෂණ වාරයේ දී ඉදිරිපත් කරන මෙන් නියෝගයක් මා විසින් ලබා දුනි.

කෙසේ වෙතත්, මෙකී ආරාවුල නැවත කැඳවන ලද 2022.01.20 දින වගඋත්තරකාර පාර්ශවය විසින් කරුණු දක්වමින් ප්‍රකාශ කරනු ලැබුවේ සංශෝධිත උත්තර ප්‍රකාශයේ 11 ඡේදයේ සඳහන් කරුණු එසේ සඳහන් වී ඇත්තේ මුද්‍රණ දෝෂයක් නිසා බවත්, 2020.07.14 සහ 2021.03.03 දිනයන් හි ගොනුකරන ලද උත්තර ප්‍රකාශවල ද එකී මුද්‍රණ දෝෂය පැවති බවත් ය.

ඒ අනුව තහවුරු වන්නේ පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් ලකුණු කරනු ලැබූ A2 පත්කිරීමේ ලිපියට අමතරව වෙනත් කිසිදු වැඩිමනත් පත්වීමේ ලිපියක් වගඋත්තරකාර ආයතනය විසින් ලබා දී නොමැති බවත්, V ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරට හිමි වැටුප සඳහන් කරනු ලැබූ පත්වීමේ ලිපියක් පැමිණිලිකාර පළමු පාර්ශවය වෙත කිසිදු අවස්ථාවක දී වගඋත්තරකාර ආයතනය විසින් ලබා දී නොමැති බවත් ය.

පැමිණිලිකාර පළමු පාර්ශවයේ ලිඛිත දේශන සමග X ලෙස ඉදිරිපත් කර ඇති ඇමුණුමෙහි සඳහන් ඉල්ලුම්කරුට අහිමි කළ වැටුප හා අවසන් ගෙවීමේ දී සිදු වූ වෙනස ඇතුළත් වාර්තාව මගින් අනාවරණය වූ පහත කරුණු වෙත අවධානය යොමු කරමි.

වර්ෂය	ශ්‍රේණි දෙක අතර මාසයක වෙනස (රු.)	මාස ගණන	වසරකට අහිමි වූ මුදල (රු)
2009	159.50	06	957.00
2010	181.50	12	2,178.0
2011	203.50	12	2,442.00
2012	473.00	12	5,676.00
2013	757.25	12	9,087.00
2014	1156.25	12	13,875.00
2015	1449.50	12	17,394.00
2016	1696.50	12	20,358.00
2017	1943.50	12	23,322.00
2018	2190.50	12	26,286.00
2019	2437.50	07	17,062.50
		සම්පූර්ණ එකතුව	**138,637.50**

පාරිතෝෂික ගෙවීම්:

ගෙවිය යුතු පාරිතෝෂික මුදල (රු.) 45,809 x 37 = 1,694,933.00
ගෙවනු ලැබූ පාරිතෝෂික මුදල (රු.) 42,601.50 x 37 = 1,576,255.50
හිඟ පාරිතෝෂික මුදල (රු.) (1,694,933.00 - 1,576,255.50) = 118,677.50

මා විසින් ඉහත සියළු කරුණු හා සාක්ෂි සලකා බැලීමෙන් පසුව පහත තීරණයන්ට එළඹුණි.

දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය විසින් පැමිණිලිකාර පළමු පාර්ශවයට හිමිකම් කියනු ලබන V ශ්‍රේණියේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරට හිමි වැටුප හා දීමනා නොගෙවීමෙන් පැමිණිලිකාර පළමු පාර්ශවයේ අයිතිවාසිකම් කඩකර ඇති බවට තීන්දු කරමි. තවද ඒ හේතුවෙන් පැමිණිලිකාර පළමු පාර්ශවයට හිමිවිය යුතු වැටුප නොලැබීම මත මූල්‍යමය අවාසියක් සිදුවී ඇති බව ද තීරණය කරමි.

ප්‍රදනය :

පැමිණිලිකාර පළමු පාර්ශවය වන එම්. ජේ. චන්ද්‍රතිලක මහතා සහ දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි, ලේඛන සහ ගොනු කරන ලද ලිඛිත දේශන සලකා බැලීමෙන් පසුව පහත තීරණයන්ට එළඹියෙමි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ V ශ්‍රේණියේ සහකාර කළමනාකාරවරයෙකු (ඉංජිනේරු වශයෙන් සේවය කරන ලද එම්. ජේ. චන්ද්‍රතිලක මහතාට අදල ශ්‍රේණියට හිමි වැටුප් තලය ලබා නොදීම යුක්ති සහගත නොවන බවත් ඔහුට හිමි වැටුප නොගෙවීමෙන් ඔහුගේ අයිතිවාසිකම් කඩ වී ඇති බවත්, හිමිවිය යුතු වැටුප නොගෙවීම මත මූල්‍යමය අවාසියක් සිදු වී ඇති බවත් තීරණය කරමි.

ඒ අනුව පැමිණිලිකාර පළමු පාර්ශවය වන එම්. ජේ. චන්ද්‍රතිලක මහතා පැමිණිල්ල මගින් ඉල්ලා ඇති සහනයන් අනුව හිමි විය යුතු හිඟ වැටුප රු. 138,637.50 ක් ද, හිඟ වැටුප මත 20% ක අධිභාර මුදලක් වන රු. 27,727.50 ක මුදලක් ද, හිඟ පාරිතෝෂික මුදල රු. 118,677.50 ක් ද ගෙවීමට දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කරමි.

මෙකී සම්පූර්ණ වන්දි මුදල වන රුපියල් දෙලක්ෂ අසූපන්දහස් හතලිස් දෙකයි ශත පනහ (රු. 285,042.50) ක මුදල පැමිණිලිකාර පළමු පාර්ශවය වන එම්. ජේ. චන්ද්‍රතිලක මහතා වෙනුවෙන් මෙම නියෝගය ගැසට් කළ දින සිට මසක් ඇතුළත ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත තැන්පත් කරන මෙන් දෙවන පාර්ශවයේ වගඋත්තරකාර ආයතනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ,
බේරුම්කරු.

2022 ජුනි මස 07 වැනි දින,

EOG 08 - 0142

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.